# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2274/14 – 2022 අප්‍රේල් 06 වැනි බදාදා – 2022.04.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණිගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 9B, යෝධගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ යෝධගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක KE/RMB/2016/89 හා 2017.01.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කැබලි 2 ට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – උළුකැටගොඩ බෝගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1470**
උතුරට: මාර්ගය හා වැබඩකුඹුර; නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට: අලිගාලවත්ත; බටහිරට: අලිගාලවත්ත හා වැබඩකුඹුර.

02. **කැබලි අක්ෂර 'B' – උළුකැටගොඩ බෝගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1625**
උතුරට: වැබඩකුඹුර; නැගෙනහිරට: උළුකැටගොඩ බෝගහමුලවත්ත; දකුණට: අලිගාලවත්ත; බටහිරට: කැබලි අක්ෂර A.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2015/Z/195.
2021 දෙසැම්බර් මස 08 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 – 0027

1A – G 36550 – 15 (2022/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*